# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2023/59 - 2017 ජුනි මස 16 වැනි සිකුරාදා - 2017.06.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වන වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: RBK/LAN/AQURE/A3/19.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: LD/05/2009/Z/302.

මහජන කටයුත්තක් සදහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශ්‍යතාව ලබාගැනීමට රජය අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක. 9බී, යෝධගම ග්‍රාම නිලධාරි වසමට අයත් සර්වේයර් ජනරාල්ගේ අංක මු. පි. කෑ. 3514 හි සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත සඳහන් ඉඩම් කැබලි:

1. **කැබලි අංක 01**

ඉඩමේ නම: දොඩම්ගස්තැන්න විස්තරය: වත්ත; හිමිකම් කියන අය: රජය; මූලික හිමිකම් කියන අය: එන්. එස්. ජේ. එස්. කරුණාරත්න, යෝධගම, පින්නවල සහ අයි. ප්‍රසන්න ගුණතිලක, වාගොල්ල, රඹුක්කන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.6454.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017.07.26 වැනි දින පෙ. ව. 10.00ට රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී සම්මුඛ විය යුතු ය.

තව ද 2017.07.07 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2 ක් සහිත ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආර්. පී. මොහාන් විජේරත්න,
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

2017 ජුනි මස 12 වැනි දින
රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

06-1152

---

### ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වන වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: ව/18/71/2005.

වර්ෂ 2013 ක් වූ ජුනි මස 07 වැනි දින අංක 1813/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද දැන්වීමේ සඳහන් මූලික පිඹුර අංකය ගම් 3834 දරණ පිඹුරේ කැබලි අංක 01, කැබලි අංක 34, 35 සහ 36 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමු.


1A – G 25734– 48 (2017/06)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. **කැබලි අංක 34**
ඉඩමේ නම: මාදන්ගහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එස්. සී. ඩී. ගුණවර්ධන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0210.

2. **කැබලි අංක 35**
ඉඩමේ නම: -; විස්තරය: පාර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආර්. ජේ. විලත්ගමුව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0020.

3. **කැබලි අංක 36**
ඉඩමේ නම: මාදන්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලකින් කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ආර්. ජේ. විලත්ගමුව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0166.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ කැබලි අංක 34-36 දක්වා 2017 ජුලි මස 24 වැනි දින පෙ. ව. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 ජුලි මස 24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතව වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2017 ජූනි මස 07 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-1153

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**
**7 වන වගන්තිය යටතේ දැන්වීමයි**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 128, විගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, විගොඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද 2016.08.11 දිනැති හා කැඩැස්තර සිතියම් අංක 510493, කලාප අංක 02 හා පත්‍ර අංකය 8 හි කැබලි අංක 491- 570 (කැබලි 41ක්) ඇති පිඹුරේ සඳහන් කැබලි සඳහා මා විසින් අංක. 1987/45 හා 2016.10.07 දිනැති රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇති ඉඩම් අත්කර ගැනීමේ 7 වැනි වගන්තිය යටතේ වන දැන්වීමෙහි 496 වැනි කැබැල්ලෙහි අත්කර ගන්නා ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 0.0444 ලෙස සඳහන් වේ. කැබලි විස්තර ලේඛනයට අනුව එය හෙක්. 0.4444 ලෙස නිවැරදි වියයුතු බව මෙයින් දැනුම් දී සිටිමි.

ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මීනුවන්ගොඩ.

2017 අප්‍රේල් මස 26 වැනි දින
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මීනුවන්ගොඩ.

06-1154

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**
**7 වන වගන්තිය යටතේ දැන්වීමයි**

*මගේ අංකය*: මීරි/ප්‍රා. ලේ/ඉ/3/2015/13.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/7/2015/එච්ඩබ්/283.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 337, වදුරව සහ අංක 337බී, මාලිගාතැන්න පහල ග්‍රාම නිලධාරී කොට්ඨාසවල, වදුරව ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 510282, කලාප අංක 03, පත්‍ර අංක 3 හා 2016.08.12 දිනැති සිතියමේ සඳහන් කැබලි සඳහා මා විසින් 1983/2 හා 2016.09.05 දිනැති රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකර ඇති කැබලි අංක 445 ලෙස කැබලි අංක 2 ක් සඳහන් වී ඇති අතර, එය පිළිවෙලින් කැබලි අංක 445 හෙක්ටයාර් 0.0897 සහ කැබලි අංක 446- හෙක්ටයාර් 0.1650 වශයෙන් නිවැරදි විය යුතු බව දන්වමි.

ප්‍රාදේශීය ලේකම්,
මීරිගම.

2017 මැයි මස 09 වැනි දින
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මීරිගම.

06-1155

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.